# මගේ ලෝකය

ඇසෙන දැනෙන දේ..
හිතට වැදෙන දේ..



ජගත් ජේ එදිරිසිංහ

## රත්න ශ්‍රී කවියා ගේ කුරුළු කූඩුව

පසුගිය සන්නසේ රත්න ශ්‍රී විජේසිංහ කවියා සමගින් සංවාදයක් කරන්නට ශ්‍රීලාල් සොහොයුරා යොමුකරන විට ඔහුට කියන්නට අමතක වූ යමක් සිහිපත් වූයේ ලිපිය කියවන විට ය. ඒ රත්න ශ්‍රී ගේ කුරුළු කූඩුවේ කතාවයි.

වසර ගණනාවකට පසු මට රත්න ශ්‍රී කවියා හමු වුණෝ පසුගිය දෙසැම්බරයේ දී ය. කලින් වතාවක් දෙකක් ඔහු හමුවීම මග හැරී ගිය නමුත් මේ වතාවේ නම් කෙසේ හෝ ඔහු හමුවන්නට මට අවශ්‍ය විය. මේ දිනවල මා අතින් සකස් කෙරෙමින් පවතින කොළඹ යුගයේ කවියකු වන හිරිකුළුවේ සුසිල් ප්‍රේමසිරි කවියාගේ කවි එකතුව සඳහා පෙරවදනක් ලියන්නට බාර දී තිබුණේ රත්න ශ්‍රී ටය. ඒ ලිපිය ඔහුගෙන් ලබා ගන්නටත් කලකින් නුදුටු මේ ප්‍රවීණ කවියා බැහැ දැකින්නටත් මට දැඩි අවශ්‍යතාවක් විය.

මගේ පවුලේ සොයුරු සොයුරියන් පිරිවරාගෙන කතරගම යන ගමනේදී රත්න ශ්‍රී සොයුරා ගේ නිවසට ගොඩ වදින්නට අපි කතිකා කර ගත්තෙමු. ඇල්පිටියේ රාත්‍රිය නැවතී උදේ ගමන් ඇරඹූ අප ගාල්ලට එන විට දහවල් දොළහ පසුවී තිබුණි. ගාලු කොටුවේ ලේන් බාන් වීදියේ රත්න ශ්‍රී කවියා ගේ නිවසට අප ගොඩ වූයේ දැඩි හිරු රැසින් ගාල්ල දැවෙමින් තිබුණ මොහොක ය.

හරිම රස්නෙයි නේද..? ආ ගිය කතා බහ කරමින් සිටියදී දහඩිය වගුරවමින් සිටි අප දෙස බැලූ අපේ කවියා බොහෝ කණගාටුවෙන් ඇසුවේ ය.

අපි සිනාසුනෙමු.

"සීලිං ෆෑන් එකක් නං තියෙනවා.. ඒත් ඒක දාන්න විදිහක් නැහැනෙ.." ඔහු කීවේ සමාව අයැදින ස්වරයකිනි. " ..කුරුල්ලො ඒකෙ කූඩුවක් හදලා.. "

රත්න ශ්‍රී ගේ සාලයේ සිවිලිමේ එල්ලා ඇති විදුලි පංකාව වැසෙන්නට තැනූ විසල් කුරුළු කූඩුවකි. කුරුල්ලන්ට ඇති සෙනෙහස නිසාවෙන් උන් එළවා දමන්නට ඔහු නොසිතයි. ඒ වෙනුවට දහඩිය දමන රස්නය ඉවසා සිටින්නට ඔහු කැමතිය.

කලාකරුවකු විය හැක්කේ එවන් සුන්දර මිනිසකුට පමණකි.

සන්නස
අන්තර්ජාලයෙන් කියවන්න
www.sannasa.net

## සැරිසරන ඥාතියා

රත්න ශ්‍රී විජේසිංහ

දේශ සීමා නොමැති කවියක් ව
පියාපත් ලබාගෙන
පුංචි ගේ කුරුල්ලෝ
නුඹ ආවෙ

චාල්ස් ඩිගෝල් නම්
සුවිසල් ගුවන්තොටුපලේ
පන්සාළිස් වන පර්යන්තයේ
ආපන ශාලාවෙ මුල්ලක
තනි මේසෙ,
මා ගාව වැටුණු
මිල අධික පාන් රොඩු
සිගිති රතු හොටින්
අහුලා කෑවෙ

මැසි මදුරු පවා නොඑන
වායු සමීකරණය කළ
සුවිශාල ආගාරෙ
කොතැනකින් රිංගල ද
වීසා නැති ව
කුරුල්ලෝ නුඹ ආවෙ

කූඩුවෙන් පිටත් වී
බිත්තියේ ගෙයි සාලෙ
ලංකාවෙ කඳුළකුත්
ඇහින් අරගෙන මොකද
මේ තරම් දුර ආවෙ

කාත් කවුරුත් නැතිව
නන්නාඳුනන රටක
කොහේ යනවාද අපි
මේ පාරෙ
හැමතැනම පාරවල්
සංසාරෙ

*"සන්ධ්‍යා තීරුවය"* 2010

*පත්තරකාරයකුගේ අත්දැකීම්*

## උඩුරාවණ ගේ කතා

පුවත් පතක් පාඨකයාගේ බුද්ධි වර්ධනයට මෙන්ම ආනන්දයටද ගෝචර වන ලෙස සකස් කිරීම සැමවිටම අපේ අභිප්‍රායයි. සැළසුම් කිරීමේ වැඩි කාලයක් ගත වන්නේ පාඨකයාට රසයක් ලබා දෙන විවිධ දේ සොයා ඉදිරිපත් කරන්නට ය.

පාඨකයාට සත පහක වැඩක් නැති මොනවා හෝ දමා පත්තර පිටු පිරවීමේ පුවත්පත් කලාවක් අප දන්නේ නැත.

උඩුරාවණ නම් ප්‍රභූවරයකුගේ කතා කාලයක සිට අප අතර ගැවසෙයි. සාදයකදී හෝ වෙනයම් සුහද හමුවකදී හෝ උඩුරාවණ ගේ කතා රස කර කීමේ පුරුද්දක් අපේ බොහෝ හිතවතුන් අතර ඇත . උඩුරාවණ නම් වන පුද්ගලයා කවිරුන් හෝ වේවා ඔහුගේ සිනා උපදවන කතා අසන්නට අපි බොහෝ කැමැත්තෙන් සිටියෙමු.

සන්නස පුවත් පත ආරම්භයේ දී මේ උඩුරාවණගේ කතා අපේ පාඨකයන් සමග බෙදා හදා ගන්නට මම සිතුවෙමි. ඒ නිසා උඩුරාවණගේ කතා නමින් කොළමක් ඇරඹුවෙමි. මාසයක් හෝ දෙකක් අපි මේ කොළම සාර්ථකව පවත්වාගෙන ගියෙමු.

එක්තරා දිනෙක පුද්ගලිකව මට ලියූ ඊමේල් පණිවුඩයක් මගේ ඊමේලට ලැබී තිබුණි. කැනඩාවේ වෙසෙන යම් කිසි කාන්තාවක විසින් ලියා තිබූ මේ ඊමේලය මගේ සිත මහත් කම්පනයට පත් කරන්නට සමත් විය. ඉංගිරිසියෙන් ලියා තිබූ පණිවුඩයේ සිංහල අර්ථය මෙසේ විය.

"මම කැනඩාවේ සිට අන්තර්ජාලය ඔස්සේ ඔබේ පුවත් පත මහත් ආශාවකින් කියවන්නෙමි. නමුත් ඔබ අලුතින් අරඹා ඇති උඩුරාවණ ගේ කතා කොළම මගේ සිතේ මහත් කණගාටුවක් ඇති කරයි. උඩුරාවණ යනු නුවර ප්‍රදේශයේ සැබැවින්ම විසූ ප්‍රභූවරයකු බව ඔබ දන්නවා හෝ නොදන්නවා හෝ විය හැකි ය. ඔහුගේ දරුවෝ තවමත් වෙසෙති. සමහරකු ඕස්ට්‍රේලියාවේ ද වෙසෙන බව මම දනිමි. තමන්ගේ පියා මේ ලෙස අපහාසයට ලක් කෙරෙනු දකින ඒ දරුවන්ගේ සිතේ කොයිතරම් කණගාටුවක් ඇති වෙනු ඇද්ද යන්න ගැන නැවත සිතා බලන මෙන් ඔබෙන් ඉල්ලා සිටිමි."

මම මහත් කම්පනයට පත්වුණෙමි. කිසිවිටෙක නොකළ යුතු යමක් මා අතින් සිදුවී තිබීම ගැන විසල් ලජ්ජාවක් මගේ සිතට ඇතිවිය. මම මගේ කණගාටුව ප්‍රකාශ කර ඇයට පිළිතුරු ඊමේලයක් යැව්වෙමි.

උඩුරාවණගේ කතා තව දුරටත් මගේ සිතේ විනෝදයක් ඇති නොකරයි.

මම ඊළඟ මාසයේ සිට උඩුරාවණගේ කොළම නවතා දැමුවෙමි.

Let's find your dream job!
Employment work shop - 2010

Venue :
Theatre R5, Rotunda,
Clayton Campus,
Monash University
Time ;
From 4.00 – 9.00 pm
(4.00 – 5.00 pm Registration)






Free Entry Workshop

- Valuable advice from prominent industry experts and CEO's.
- How to make an attractive resume & present yourself in an interview?
- Melbourne's hidden job markets - they all not advertised
- Opportunity to get one on one with prospective employers and agents
- How to form an effective network?
- Find out all about effective job seeking, challenges and how to manage them.

Make use of this valuable opportunity and book now......
email: japuraalumni@hotmail.com
Phone: Susil 0424 323 360,
Millon 042767 3333